**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - 2021**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ (සමාගම්වලට අදාළ නැත) විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 3 අනුව ප්‍රත්‍යාවර්තව ගැලපීමකින් තොරව රු.27,979,710 ක පෙර වර්ෂ දෝෂ නිවැරදි කිරීම පෙර වර්ෂයේ ගැලපීම ලෙස සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගලපා ඇත. | ප්‍රමිතියට අනුව ගැලපීමට පියවර ගන්නා බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 7 හි 65 වැනි ඡේදය අනුව ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. රු.766,109,399 ක් වටිනා දේපළ, පිරිවැය සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා වෙමින් පවතී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 3 ට අනුකූලව ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 7 හි 47 ඡේදයට අනුව, සෑම වසර තුනකට හෝ පහකට වරක් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය විය හැකිය. කෙසේ වෙතත්, 2011 වසරේ රු.450,330,000ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබූ විශ්වවිද්‍යාලයේ ඉඩම් 05ක් පසුගිය වසර 10ක කාලය තුළ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය ඉක්මනින් අවසන් කරන බව. | -එම- |

#### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ගෘහ භාණ්ඩ හා උපකරණවල පිරිවැය රු.2,158,550,419 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වන ලද සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව එහි පිරිවැය රු.1,923,388,792 ක් විය. රු.235,161,627 ක වෙනස සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වටිනාකමේ වෙනස හඳුනා ගැනීමට පියවර ගන්නා බව. | වෙනස සැසඳීමට කිරීමට පියවර ගත යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කාර්ය මණ්ඩලයෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ ආයතනවලින් ලැබිය යුතු රු.1,876,449 ක ශේෂයන් 2021 දෙසැම්බර් 31 දිනට අයකර නොගෙන වසර 01 සිට 20 දක්වා කාලයක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන්ගෙන් අයකර ගැනීමට නියමිත රු.18,337,779ක බැඳුම්කර වටිනාකමෙන් රු.1,043,137ක මුදලක් වසර 12කට වැඩි කාලයක් හිඟව පැවතුණි. | ඒ සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලය විසින් වසර 02කට වැඩි කාලයක් පැවති රු.687,007ක ගෙවිය යුතු ශේෂයන් පියවීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ගෙවිය යුතු මුදල් පියවීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මුදල් රෙගුලාසි වල 571 මුදල් රෙගුලාසිය | නැවත ගෙවිය හැකි රු.566,000ක ටෙන්ඩර් තැන්පතු 80ක් සහ රු.18,267,884ක රඳවා | ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගැනීමේ මුදල් 40ක් වසර 02 සිට 08 දක්වා කාලය තුළ පැවතීම තිබීම සම්බන්ධයෙන් නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 උප වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 චක්‍රලේඛය. | සියලුම කාර්ය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රය හරහා පැමිණීම සනාථ කළ යුතු වුවද අධ්‍යයන කාර්ය මණ්ඩලය එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | සාමාන්‍ය භාවිතයක් ලෙස, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම සටහන් නොකරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**
-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 32,976,512 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 19,668,820 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 52,645,332 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන ආදායමේ සහ ස්වයං මූල්‍යන වැඩසටහන් මත ශුද්ධ ආදායමේ පිළිවෙලින් සියයට 7 ක සහ සියයට 40 ක වැඩිවීම සහ පසුගිය වර්ෂයට සාපේක්ෂව පාරිතෝෂික වියදම් වල සියයට 35 ක අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**
--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පෞද්ගලික වැටුප් වැනි වියදම් පෙර වසරට සාපේක්ෂව රු.86,476,906කින් හෝ සියයට 7කින් ඉහළ ගොස් තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෑම දිනකම අවසානයේ REPO තැන්පතුවේ මුදල් තැන්පත් කර අමතර ආදායමක් උපයා ගැනීම අනෙකුත් විශ්වවිද්‍යාලවල සාමාන්‍ය සිරිත වුවද, විශ්වවිද්‍යාලයේ වගකිවයුතු නිලධාරීන් එසේ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සෑම දිනකම අවසානයේ ජංගම ගිණුමේ රු. මිලියන 84 සිට රු. මිලියන 211 දක්වා මුදල් ශේෂයක් තිබූ බව නිරීක්ෂණය විය. | ජංගම ගිණුම් එක් දින ආයෝජන ගිවිසුම්වලට සම්බන්ධ කිරීමට කටයුතු කරන බව. | ඵලදායී ලෙස මුදල් තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලයෙන් (LEARN) ලැබුණු අසීමිත දත්ත ජාල සම්බන්ධතාවය වෙනුවෙන් 2021 වර්ෂය සඳහා රු.12,835,303 ක මුදලක් ගෙවා තිබුණි. අනෙක් අතට, 2021 වර්ෂය සඳහා එම කාර්යය සඳහාම Mobitel වෙතින් wifi පහසුකම ලබා ගැනීම සඳහා රු.11,869,245 ක මුදලක්ද ගෙවා තිබුණි. දත්ත ජාල සම්බන්ධතාව සඳහා වන වියදම් පාලනය කිරීමට සහ අඩු කිරීමට LEARN ජාල සේවාව පමණක් භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | පවතින මූල්‍ය බාධාවන් හේතුවෙන් එම යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් පවතින බව. | වියදම් පාලනය කිරීමට සහ අඩු කිරීමට LEARN ජාල සේවාව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා රු.201,368,432 ක පුස්තකාල පොත් සහ වාර සඟරා සත්‍යාපනය කර නොමැති අතර අවසාන සත්‍යාපනය 2017 වර්ෂය සඳහා සිදු කර ඇත. | තොග සත්‍යාපනය සිදුකිරීමට කටයුතු කරන බව. | තොග සත්‍යාපනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ අධ්‍යයන වගවීම අනුව ප්‍රධානියා, ප්‍රධාන මහාචාර්ය, මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, උපදේශක I ශ්‍රේණිය සහ II ශ්‍රේණියේ උපදේශකවරයා විසින් වසරකට අවම ශිෂ්‍ය සම්බන්ධතා පැය ගණන පුද්ගලික කාලසටහනේ පිළිවෙලින් පැය 180, 300, 360, 380, 450, 480 සහ 510 ලෙස පිළිබිඹු විය යුතුය. විගණනය සඳහා ලබා දී ඇති තොරතුරුවලට අනුව, 2021 වර්ෂය තුළ පීඨ 6ක අධ්‍යයන කාර්ය මණ්ඩලය 140ක් අතර ශිෂ්‍ය සම්බන්ධතා පැය 55,000ක් වෙන් කර තිබිය යුතු අතර, ඉහත සම්මතයන්ගෙන් සියයට 43ක් නියෝජනය වන පරිදි වෙන් කර තිබුණේ පැය 23,665ක් පමණි. තවද, ශිෂ්‍ය පර්යේෂණ හෝ කාර්මික ස්ථානගත කිරීම්, සායනික කටයුතු සහ අධ්‍යයන සම්බන්ධීකරණය අධීක්ෂණය සඳහා වැඩ සම්මත ප්‍රතිපාදන සනාථ කිරීම සඳහා කිසිදු වාර්තාවක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ බැවින්, විශ්ව විද්‍යාලය එම සමස්ත ශිෂ්‍ය සම්බන්ධතා පැය සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ වැඩ ප්‍රමාණය පිළිබිඹු කිරීමට කාර්යය සම්මතයන් මත පදනම්ව මාර්ගෝපදේශයක් සකස් කර ඇති බව තහවුරු කර ගත නොහැක. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය මත පදනම් වූ නව සංශෝධිත මාර්ගෝපදේශය සිසුන්ගේ මුළු සම්බන්ධතා පැය ගණන සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ වැඩ ප්‍රමාණය පිළිබිඹු වන පරිදි ඉක්මනින් සකස් කරන බව. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ ශිෂ්‍ය සම්බන්ධතා වේලාවන් සහ සම්පූර්ණ වැඩ ප්‍රමාණය පිළිබිඹු කිරීම සඳහා වැඩ සම්මතයන් මත පදනම්ව මාර්ගෝපදේශයක් සකස් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ශාස්ත්‍රවේදී උපාධිය, ව්‍යාපාර පරිපාලන උපාධිය සහ වාණිජවේදී උපාධිය සඳහා වන බාහිර උපාධි පාඨමාලා පිළිබඳ ශිෂ්‍ය මාර්ගෝපදේශ පොත්වලට අනුව, උපාධි | පිළිතුරු පත්‍ර ලකුණු කිරීම සම්පූර්ණ කිරීමට ගත වූ කාලය හේතුවෙන් ප්‍රධාන | නිශ්චිත කාල සීමාව තුළ උපාධි පාඨමාලා අවසන් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | වැඩසටහන් සම්පූර්ණ කළ යුතු අවම කාලය අධ්‍යයන වර්ෂ 03 කි. කෙසේ වෙතත්, ඉහත උපාධි වැඩසටහන් වසර 05 සිට 07 දක්වා අවම කාල සීමාවක් සම්පූර්ණ කිරීමට ගෙන තිබුණි. උපාධි පාඨමාලාව අවසන් කිරීම ප්‍රමාද වීමෙන් සිසුන්ගේ වෘත්තීය සහ රැකියා අවස්ථාවන්ට අහිතකර ලෙස බලපානු ඇත. | ප්‍රමාදය සිදු වූ බව. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | පසුගිය වර්ෂවල විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා පර්යේෂණ දීමනාව ගෙවා ඇති අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් ගෙවා ඇති පර්යේෂණ දීමනාව රු.80,871,935 කි. කෙසේ වෙතත්, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර වැනි බුද්ධිමය දේපළ අත්පත් කර ගෙන නොතිබූ අතර වෙනත් ජයග්‍රහණ ලබාගෙන නොමැත. ඒ අනුව පර්යේෂණ දීමනා වියදම් හරහා රටට හෝ කලාපයට කිසිදු දායකත්වයක් ලැබී නොමැති බව නිරීක්ෂණය විය. | අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කරන ලද සැලකිය යුතු පර්යේෂණ හේතුවෙන් අනාගත නවෝත්පාදන සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ අපේක්ෂාවක් පවතින බව. | නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර පර්යේෂණවලින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අන්තර්ජාල ශ්‍රේණිගත කිරීම්වලට අනුව විශ්වවිද්‍යාලය 2022 දී 13 සිට 16 දක්වා පසුගාමී වී ඇත. | අන්තර්ජාල ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමු කර ඇති බව. | විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට පියවර ගත යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාලයේ පවතින විෂයයන් සහ විෂය නිර්දේශයන් රටේ රැකියා වෙළෙඳපොළට සහ ජාතික ආර්ථිකයට ගැළපෙන පරිදි යාවත්කාලීන කළ යුතු අතර, දිනෙන් දින වෙනස් වන රැකියා වෙළෙඳපොළට අනුගත වන පරිදි තාක්ෂණික විෂයයන් සහ භාෂා කුසලතා විෂය මාලාවට ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, කළමනාකරණ සහ වාණිජ පීඨයේ ව්‍යාපාර පරිපාලන උපාධිය සහ වාණිජවේදී උපාධිය සඳහා විෂය නිර්දේශය 2012 වසරේ සිට වසර 09ක් පුරා සංශෝධනය වී නොමැති බවත්, ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨයේ ශාස්ත්‍රවේදී උපාධිය 2005 සිට වසර 16 ක් පුරා සංශෝධනය කර නොමැති බවත් නිරීක්ෂණය විය. | වෙනස්වන ප්‍රවණතා පිළිබිඹු කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගැනීම සහ අවශ්‍ය වෙනස්කම් සංශෝධනවලට ඇතුළත් කරන බව. | විෂයමාලාවන් රැකියා වෙළෙඳපොළට ගැලපෙන ලෙස සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2017 සිට 2020 දක්වා කාලය තුළ නිලධාරීන් 20 දෙනෙකු සඳහා රු.6,545,485 ක පර්යේෂණ ආධාර ප්‍රදානය කර තිබුණද, නිලධාරීන් 10 දෙනෙකු 2022 ජූනි 15 වන දින දක්වාම පර්යේෂණ අවසන් කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තිදෙනෙකු මේ වන විට අවසන් වාර්තාව සකස් කරමින් සිටින බව හා අනෙක් තිදෙනා පර්යේෂණය අවසන් කිරීමට කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇති බව. | පර්යේෂණ ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී රු.10,221,473 ක වියදමින් මෙගා ගබඩාවේ ඉදිකිරීම් අවසන් කර තිබූ අතර 2021 පෙබරවාරි 23 වන දින රු. මිලියන 5.25 ක නවීකරණ කටයුතු සඳහා ඉංජිනේරු වැඩමුළුව වෙත භාර දෙන ලදී. කෙසේ වෙතත්, 2022 මැයි 26 වන දින දක්වාම උපකරණ ස්ථාපනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බැවින් වැඩමුළුව සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | නුදුරු අනාගතයේ දී මෙම කණ්ඩායම **6** අධ්‍යයන වාරයට මාරු වන විට **E17** කණ්ඩායමේ සිසුන්ට මෙම උපකරණ ප්‍රදර්ශනය කරන බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 වසරේ සිට 2019 වසර දක්වා කාලය තුළ රු.87,186,796 ක මුදලකට මිලදී ගෙන ඇති රසායනාගාර උපකරණ වසර 02 සිට 05 දක්වා කාලයක් අක්‍රියව පැවතුණි. | මෙවලම් නොමැතිකම හේතුවෙන් CNC හැරවුම් මධ්‍යස්ථානය භාවිතා නොකළ බව. | උපකරණ ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

3.4 **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මල්වත්ත කෘෂි තාක්ෂණ උද්‍යානයේ යටිතල පහසුකම් සංවර්ධන කොන්ත්‍රාත්තුව 2021 මාර්තු 29 වන දින රු.138,444,958 ක කොන්ත්‍රාත් වටිනාකමකට ප්‍රදානය කර ඇති අතර ගිවිසුමට අනුව 2022 ජුනි 28 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් භෞතික ප්‍රගතිය සියයට 35ක් පමණක් වූ අතර කොන්ත්‍රාත් වටිනාකම රු.56,273,588ක් වූ වැඩ ඒකක 09ක් 2022 මැයි 01 දින දක්වාම ආරම්භ කර නොතිබුණි. | මේ වන විට එහි වැඩකටයුතු ආරම්භ කිරීමට සියලු කටයුතු සිදු කර ඇති බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

### 4.1 **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2021 වර්ෂය සඳහා වූ උපාය මාර්ගික සැලැස්මට අනුව ඉලක්ක හයක් යටතේ ක්‍රියාකාරකම් අනූවක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒවායින් 17ක කුමන හෝ කටයුත්තක් ආරම්භ කර නොතිබුණි. සමස්ත උපාධිධාරීන්ගේ තෘප්තියේ ප්‍රගතිය; නව අධ්‍යයන වැඩසටහන් සහ දෙපාර්තමේන්තු හඳුන්වා දීම; උපාධිධාරීන්ගේ කාර්මික පුහුණුව සම්පූර්ණ කිරීම; ජාත්‍යන්තර සම-කර්තෘවරුන් සමඟ අධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රකාශන සහ කාර්ය මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තරව සහයෝගී වූ පර්යේෂණ ලිපි පහළ මට්ටමක පැවතුනි. | Covid-19 තත්ත්වය සහ භාණ්ඩාගාරයෙන් ලැබුණු සීමිත මූල්‍ය ප්‍රතිපාදන හේතුවෙන් උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ පරාසය සීමා කිරීමට සිදුවී ඇති බව. | ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |